රුහුණ විශ්වවිද්‍යාලය

**2020/2021 වර්ෂය සඳහා ආපනශාලා**
**පවත්වාගෙන යාම සඳහා ප්‍රසම්පාදන කැඳවීම**

රුහුණ විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩලයට 2020/2021 වර්ෂ තුළදී ආහාරපාන සැපයීම සඳහා ආපනශාලා පවත්වාගෙන යාමට පිළිගත් ආයතන වලින් සහ පළපුරුදු පුද්ගලයින්ගෙන් **2021.02.12** දින ප.ව. 2.00 දක්වා ප්‍රසම්පාදන අයදුම්පත්‍ර භාරගනු ලැබේ. සේවා අවශ්‍ය කරන ආපනශාලා පහත දක්වා ඇත.

## කාර්ය මණ්ඩල සන්ථාගාර ආපනශාලාව, වැල්ලමඩම, මාතර

ප්‍රසම්පාදන ආකෘති පත්‍ර සහ විස්තර ලබා ගැනීම සඳහා ආපසු ගෙවනු නොලබන රු. 1000/-ක ගාස්තුවක් මෙම විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් ලදුපත මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ නියෝජ්‍ය ලේඛකාධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය. කාර්යාල දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 අතර වේලාවන් තුළදී මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය ට පැමිණීමෙන් **2021.01.21** සිට **2021.02.12** දින දක්වා ප්‍රසම්පාදන අයදුම්පත් ලබා ගත හැකිය. විශ්වවිද්‍යාලය තුළ ආපනශාලා පවත්වාගෙන යාමට නුසුදුසු බවට විශ්වවිද්‍යාලය විසින් තීරණය කර ඇති කිසිදු ආයතනයකට හෝ පුද්ගලයකුට ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කරනු නොලබනු ඇත.

සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන අයදුම්පත් මුද්‍රා තබා නියමිත දිනට පෙර නියෝජ්‍ය ලේඛකාධිකාරි මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ කාර්යාලය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ගෙනවිත් භාර දෙන්නේ නම් නියෝජ්‍ය ලේඛකාධිකාරි මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බාරලිය යුතුය. අදාළ ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සන්ථාගාර ආපන ශාලාව ලෙස නම පැහැදිලිව සඳහන් කල යුතුය.

ඔබගේ දුරකථන අංකයට ප්‍රසම්පාදන විවෘත කරන දිනය වේලාව දන්වන අතර ඔබට හෝ ඔබගේ නියෝජිතයකුට එම අවස්ථාවට සහභාගි විය හැකිය.

සභාපති / විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව
රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
2021.01.20